# ගෙවුම් තුලනය

## සමස්ත උපනතීන්


1991 වර්ෂයේදී ශ්‍රී ලංකාවේ ගෙවුම් තුලනය මිශ්‍ර ප්‍රතිඵල පෙන්නුම් කෙරිණි. අභ්‍යන්තර හා බාහිර වශයෙන් ඇති වූ විවිධ ප්‍රතිපත්තිමය වෙනස් කම් සහ ඇතැම් අහිතකර සංවර්ධනයන්ගේ බලපෑම ඊට හේතු විය. 1990 දී විගැහි දශ ලක්ෂ 518 (රුපියල් දශ ලක්ෂ 28,145)ක් වූ වෙළෙඳ හිඟය 1991 දී විගැහි දශ ලක්ෂ 725 (රුපියල් දශ ලක්ෂ 41,184) දක්වා වැඩි විය. සේවා ගිණුමේ හිඟය 1990 දී පැවති විගැහි දශ ලක්ෂ 72 (රුපියල් දශ ලක්ෂ 3,904) හා සසඳා බලන විට, 1991 දී විගැහි දශ ලක්ෂ 78 (රුපියල් දශ ලක්ෂ 4,448) දක්වා, සියයට 8 කින් වැඩි විය. මේ අතර පෞද්ගලික ප්‍රේෂණ වලින් දළ ලැබීම් 1990 දී විගැහි දශ ලක්ෂ 296 (රුපියල් දශ ලක්ෂ 16,054) සිට 1991 වර්ෂයේදී විගැහි දශ ලක්ෂ 320 (රුපියල් දශ ලක්ෂ 18,119) දක්වා වැඩි විය. 1990 දී පැවති විගැහි දශ ලක්ෂ 130 (රුපියල් දශ ලක්ෂ 7,142) ක් වූ නිල සංක්‍රාමද 1991 වර්ෂයේදී විගැහි දශ ලක්ෂ 143 (රුපියල් දශ ලක්ෂ 8,170) දක්වා වැඩි වීමක් පෙන්නුම් කෙරිණි. 1990 වර්ෂයේ විගැහි දශ ලක්ෂ 192 (රුපියල් දශ ලක්ෂ 10,390) වූ ජංගම (වර්තන) ගිණුමේ හිඟය, 1991 වර්ෂයේදී විගැහි දශ ලක්ෂ 372 (රුපියල් දශ ලක්ෂ 21,127) දක්වා වැඩි වීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ වෙළඳ ගිණුමේ දක්නට ලැබුණු සැලකිය යුතු පිරිහීමයි. ජංගම ගිණුමේ හිඟය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස බලන විට, වර්ෂ දෙක තුළදී සියයට 3.2 සිට සියයට 5.6 දක්වා වැඩි විය.

මීට ප්‍රතිවිරුද්ධව 1991 වර්ෂයේදී ප්‍රාග්ධන ගිණුමේ යහපත් උපනතියක් පෙන්නුම් කෙරිණි. විශේෂයෙන්ම, විදේශීය සෘජු ආයෝජන හා මූල්‍ය හා ප්‍රාග්ධන වෙළෙඳ පොල ආයෝජන ඇතුළත්, පෞද්ගලික විදේශීය ප්‍රාග්ධන සැලකිය යුතු ලෙස ගලා ඒමක් පැවති අතර, රජයේ විදේශීය ණය ලැබීම් ද වැඩි විය. මෙනිසා, 1991 වර්ෂයේදී ශුද්ධ මූල්‍ය නොවන ප්‍රාග්ධන ලැබීම් විගැහි දශ ලක්ෂ 475 දක්වා සියයට 38 කින් වැඩි විය. මෙය ජංගම ගිණුමේ හිඟය පියවාලීමට අවශ්‍ය ප්‍රමාණයට වඩා වැඩි ප්‍රමාණයක් විය. මෙහි ශුද්ධ ප්‍රතිඵලය වූයේ පසුගිය වර්ෂයේ විගැහි දශ ලක්ෂ 133 ක් වූ සමස්ත ශේෂය මෙම වසරේදී විගැහි දශ ලක්ෂ 150 දක්වා වැඩි වීමයි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් 1990 වර්ෂය අවසානයේදී විගැහි දශ ලක්ෂ 602 ක් වූ මුළු දළ විදේශීය වත්කම්, 1991 වර්ෂය අවසානය වන විට විගැහි දශ ලක්ෂ 809 දක්වා වැඩි විය. මෙම දළ සංචිත ප්‍රමාණය 1992 අපේක්ෂිත ආනයනයන්ගෙන් මාස 4.2 ක ප්‍රමාණය මූල්‍යනය කිරීමට ප්‍රමාණවත් විය.

ගෙවුම් තුලනයෙහි ඉහත ක්‍රියාකාරීත්වයන් මගින්, විවිධ ප්‍රතිපත්තිමය වෙනස් වීම් හා ඇතැම් අහිතකර සිදුවීම්වල ඒකාබද්ධ ප්‍රතිඵලය පෙන්නුම් කෙරිණි. මෙම වර්ෂයේදී ප්‍රතිපත්තිමය වශයෙන්, වෙළෙඳ හා ගෙවීම් ක්‍රමය තව දුරටත් නිදහස් කිරීම සඳහා වෙළෙඳ හා සේවා මත පැවැති විනිමය රෙගුලාසි හා සීමා කිහිපයක් තවදුරටත් ලිහිල් කරන ලදී. ඊට අමතරව විදේශීය ප්‍රාග්ධන ලැබීම් වැඩි කිරීමට දැරූ නිශ්චිත ප්‍රයත්නයක් වශයෙන්, ආයෝජන අනුමතයන් සඳහා වූ ක්‍රියාවලී ලිහිල් කිරීම, බදු විරාම, සහදායි තීරු ගාස්තු, පවත්නා විනිමය පාලන නිදහස් කිරීම් ආදිය සහිත නව දිරි ගැන්වීම් මාලාවක් විදේශීය ආයෝජකයින්ට පිරි නමන ලදී. මේ අතර වර්ෂය තුළ තේ වෙළෙඳ පොළ මිල පහත වැටීමකට මුහුණ දුන් අතර, රබර් හා පොල් නිෂ්පාදනයෙහි අඩුවීමක් පෙන්නුම් කෙරිණි. තවදුරටත් ප්‍රධාන මුදල් වර්ගවල හරස් විනිමය අනුපාතිකයන්හි පැවති විශාල විචලනයන්ට අමතරව, 1991 මැද භාගයේදී ඉන්දියානු රුපියලද සැලකිය යුතු තරමින් අව ප්‍රමාණය කරන ලදී. මෙම වාතාවරණය තුළ තේ මිල පහත වැටීම නිසා අඩු වූ අපනයන ආදායම

# ගෙවුම් තුලනය

ත්‍රෛමාසිකව




ශ්‍රී ලංකා මහ බැංකුව.

1. 43 සංඛ්‍යා සටහන

## 1987 - 1991 ගෙවුම් තුලනය-විශ්ලේෂණාත්මක ඉදිරිපත් කිරීම

| ශීර්ෂය | විගැහි දශ ලක්ෂ | | | | | රුපියල් දශ ලක්ෂ | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1987 | 1988 | 1989 | 1990(අ) | 1991(ආ) | 1987 | 1988 | 1989 | 1990(අ) | 1991(ආ) |
| 1. වෙළෙඳ භාණ්ඩ .. .. | -525 | -568 | -530 | -518 | -725 | -20,005 | -24,268 | -24,050 | -28,145 | -41,184 |
| අපනයන .. .. | 1,077 | 1,098 | 1,207 | 1,456 | 1,491 | 41,097 | 46,985 | 56,175 | 79,481 | 84,378 |
| ආනයනය .. .. | 1,602 | 1,666 | 1,737 | 1,974 | 2,216 | 61,102 | 71,253 | 80,225 | 107,626 | 125,562 |
| 2. සේවා .. .. | -121 | -114 | -123 | -72 | -78 | -4,625 | -4,884 | -5,609 | -3,904 | -4,448 |
| ලැබීම් .. .. | 307 | 306 | 315 | 391 | 465 | 11,721 | 13,097 | 14,597 | 21,363 | 26,371 |
| ගෙවීම් .. .. | 428 | 420 | 438 | 463 | 543 | 16,346 | 17,981 | 20,207 | 25,268 | 30,819 |
| 3. භාණ්ඩ හා සේවා (1 + 2) .. .. | -646 | -682 | -653 | -590 | -803 | -24,630 | -29,152 | -29,660 | -32,049 | -45,631 |
| 4. සංක්‍රාම (ශුද්ධ) .. .. | 381 | 392 | 405 | 398 | 431 | 14,537 | 16,775 | 18,591 | 21,659 | 24,504 |
| පෞද්ගලික (ශුද්ධ) .. .. | 242 | 238 | 258 | 268 | 288 | 9,226 | 10,187 | 11,840 | 14,518 | 16,334 |
| නිල (ශුද්ධ) .. .. | 139 | 154 | 147 | 130 | 143 | 5,311 | 6,588 | 6,751 | 7,142 | 8,170 |
| 5. ජංගම ගිණුම් ශේෂය (3 + 4) .. .. | -265 | -290 | -248 | -192 | -372 | -10,093 | -12,377 | -11,069 | -10,390 | -21,127 |
| 6. මූල්‍ය නොවන ප්‍රාග්ධනය (ශුද්ධ) .. | 234 | 194 | 216 | 344 | 475 | 9,058 | 8,308 | 10,566 | 18,932 | 27,138 |
| සෘජු ආයෝජන .. | 45 | 32 | 14 | 31 | 74 | 1,727 | 1,382 | 633 | 1,684 | 4,234 |
| පෞද්ගලික දිගුකාලීන (ශුද්ධ) .. | 6 | -32 | -39 | -33 | -23 | 213 | -1,341 | -1,803 | -1,835 | -1,300 |
| පෞද්ගලික කෙටිකාලීන (ශුද්ධ) .. | 30 | 12 | 72 | 48 | 34 | 1,217 | 474 | 3,557 | 2,685 | 2,035 |
| රාජ්‍ය දිගුකාලීන (ශුද්ධ) .. .. | 153 | 182 | 169 | 298 | 367 | 5,901 | 7,793 | 8,179 | 16,398 | 20,910 |
| ලැබීම් .. .. | 265 | 304 | 291 | 392 | 461 | 10,162 | 13,042 | 13,811 | 21,497 | 26,275 |
| ගෙවීම් .. .. | 112 | 122 | 122 | 93 | 95 | 4,261 | 5,249 | 5,632 | 5,100 | 5,366 |
| රාජ්‍ය කෙටිකාලීන .. .. | - | - | - | - | 23 | - | - | - | - | 1,260 |
| 7. රුපියල් අගය පිළිබඳ ගැලපිලි .. .. | - | - | - | - | - | 1,841 | 7 | -108 | 751 | 235 |
| 8. විගැහි වෙන් කිරීම් .. .. | - | - | - | - | - | - | - | - | - | - |
| 9. වැරදීම් හා අත්හැරීම් .. .. | -31 | +32 | -34 | -19 | +47 | -2,030 | +723 | -1,294 | -2,097 | +3,723 |
| 10.සමස්ත ශේෂය .. .. | -62 | -64 | -67 | +130 | +150 | -1,224 | -3,339 | -1,905 | +7,196 | +9,969 |
| 11.මූල්‍ය වෙනස්වීම් (-අතිරික්තය) .. .. | +62 | +64 | +67 | -130 | -150 | +1,224 | +3,339 | +1,905 | -7,196 | -9,969 |
| විනිමය අනුපාතිකය-ශ්‍රී ලංකා රුපියල්/ විගැහි | | | | | | 38.10 | 42.76 | 46.19 | 54.42 | 56.61 |
| දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් | | | | | | | | | | |
| වෙළඳ ගිණුම | | | | | | -10.17 | -10.93 | -9.58 | -8.77 | -10.97 |
| ජංගම ගිණුම | | | | | | -5.12 | -5.58 | -4.41 | -3.24 | -5.63 |
| ජංගම ගිණුම-ප්‍රදානයන් ඉවත්කළ පසු | | | | | | -7.81 | -8.54 | -7.10 | -5.46 | -7.81 |

(අ) සංශෝධිත (ආ) තාවකාලික

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

සටහන: මූල්‍ය අංශයේ සියළු ගණුදෙනු කාලච්ඡේදය අවසානයේ පැවති විනිමය අනුපාතිකය අනුව පරිවර්තනය කොට ඇත.

සහ විනිමය පාලන ලිහිල් කිරීම හා ආනයන ආශ්‍රිත විදේශීය ආයෝජන ලැබීම් වැඩි වීමෙන් සිදු වූ ආනයන ඉහළ යාම වෙළෙඳ ගිණුමෙහි පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු විය.

## ගෙවුම් තුලන විග්‍රහය

### වෙළෙඳ ගිණුම

1991 ගෙවුම් තුලන විග්‍රහයෙහි එක් අයහපත් ලක්ෂණයක් වූයේ වෙළෙඳ ගිණුමේ වූ සැලකිය යුතු පිරිහීමයි. 1991 දී අපනයන ආදායම වූ විගැහි දශ ලක්ෂ 1,491 (රුපියල් දශ ලක්ෂ 84,378) 1990 ඉපැයීම් වලට වඩා සියයට 2 ක වැඩිවීමක් පෙන්නුම් කෙරිණි. මෙම සුළු වැඩිවීම, 1990 වර්ෂයට සාපේක්ෂව විගැහි දශ ලක්ෂ 2,216 (රුපියල් දශ ලක්ෂ 125,562) දක්වා සියයට 12 කින් වැඩි වූ ආනයන හා සසඳා බලන විට අසතුටුදායක විය. අපනයන සඳහා ප්‍රධාන වශයෙන් බලපෑ අහිතකර හේතුන් වූයේ තේ මිලෙහි පහත වැටීම සහ අතිකුත් සාම්ප්‍රදායික කෘෂිකාර්මික අපනයන ආදයම අඩුවීමයි. මේ අතර, විශේෂයෙන්ම එ.ජ.ඩොලර් 1,000 ට අඩු ආනයනයන් සඳහා ණයවර ලිපි අවශ්‍යතාවයන් ඉවත් කිරීම, අපනයනකරුවන්ට අවශ්‍ය අමු ද්‍රව්‍ය ආනයන සඳහා වි. ව්‍යා. මූ. බැ. ඒකක තුළින් ණය පහසුකම් ලබාදීම සහ කල්පසු වූ ගෙවීම් යටතේ වූ ආනයන සඳහා ණයවර ලිපි ලබා ගැනීමට තිබූ විනිමය පාලන පූර්ව අනුමැතිය ඉවත් කිරීම ඇතුළු විනිමය හා වෙළෙඳ පාලනයන් ලිහිල් කිරීම් ආනයනයන්හී විශාල වැඩි වීමට දායක විය. තවද, වර්ෂය මැද භාගයේදී ඉන්දියානු රුපියලෙහි කරන ලද අව ප්‍රමාණය හේතුවෙන් එරටින් කරන ලද ආනයනයන් සාපේක්ෂ වශයෙන් ලාභදායී විය. මෙම සාධකයන්හි සමස්ත ප්‍රතිඵලය වූයේ 1990 දී විගැහි දශ ලක්ෂ 518 සිට 1991දී විගැහි දශ ලක්ෂ 725 දක්වා වෙළෙඳ ගිණුමේ ඇති වූ සැලකිය යුතු පිරිහීමයි.

### සේවා ගිණුම

1991 දී සේවා ගිණුමෙහි ලැබීම් හා ගෙවීම් දෙඅංශයෙහිම සැලකිය යුතු වැඩි වීමක් වාර්තා කෙරිණි. ප්‍රධාන වශයෙන් එයාර් ලංකා මගී ගාස්තු හා වරාය ආදායම් වැඩිවීම හේතු කොටගෙන වරාය, ප්‍රවාහනය හා රක්ෂණ යන අංශවල ශුද්ධ ලැබීමක් පෙන්නුම් කෙරිණි. වර්ෂය තුළදී සංචාරකයින්ගේ පැමිණීම වැඩිවීම හේතුවෙන් සංචාර ගිණුමෙහි ලැබීම් සියයට 21 කින් වැඩි වූ අතර, විදේශ ගමන් ඉහළ යාම නිසා එම ගිණුමෙහි ගෙවීම් අංශයෙහිද සියයට 31 ක වැඩිවීමක් පෙන්නුම් කෙරිණි. මේ අනුව, සංචාර ගිණුමේ ශුද්ධ වැඩිවීම සියයට 8 ක් විය. ආයෝජන ආදායම් ගිණුමේ ලැබීම් හා ගෙවීම් දෙඅංශයෙහිම වැඩිවීමක් පෙන්නුම් කළ නමුත්, ගෙවීම්, ලැබීම්වලට වඩා වැඩි විය. රටේ විදේශ වත්කම් තත්ත්වය යහපත් වීම වැඩි වූ ඉපැයීම් පිලිඹිබුවකි. පෞද්ගලික අංශයෙහි ණය මත පොළී ගෙවීම් වැඩිවී තිබුණු අතර, රජයේ ණය මත පොළී ගෙවීම් ද වර්ෂය තුළදී ඉහළ නැගුණි. මේ අතර "අතිකුත් සේවා" ශීර්ෂයෙහි සියයට 25 ක සැලකිය යුතු වැඩිවීමක් පෙන්නුම් කෙරිණි. මෙය ප්‍රධාන වශයෙන් විවිධ වෘත්තීමය සේවාවන්ගේ ආදයම් ඉහළ යාම නිසා ඇති විය. කෙසේ වුවත්, මහවැලි සංවර්ධන වැඩ පිළිවෙළට අයත් මාදුරු ඔය ව්‍යාපෘතියෙහි, එක්සත් ජනපද කොන්ත්‍රාත් කරුවන් සඳහා කරන ලද විගැහි දශ ලක්ෂ 36 ක (එ.ජ. ඩොලර් දශ ලක්ෂ 50) විශේෂ ගෙවීම, නිසා මෙම අංශයේ ගෙවීම්වල තියුණු වැඩිවීමක් පෙන්නුම් කෙරිණි. මෙම අනපෙක්ෂිත ගෙවීම් රහිතව බලන විට1991 වර්ෂයෙහි සේවා ගිණුමෙහි සැලකිය යුතු දියුණුවක් පෙන්නුම් කෙරේ.

## 1987-1991 සේවා සහ සංක්‍රාම

| ශීර්ෂය | විගැහි දශ ලක්ෂ | | | | | රුපියල් දශ ලක්ෂ | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1987 | 1988 | 1989 | 1990 (අ) | 1991 (ආ) | 1987 | 1988 | 1989 | 1990 (අ) | 1991(ආ) |
| 1. වරාය, ප්‍රවාහනය හා රක්ෂණය .. | 2 | 5 | - 8 | 10 | 18 | 25 | 205 | -322 | 522 | 1,026 |
| ලැබීම් .. | 89 | 95 | 102 | 125 | 142 | 3,366 | 4,057 | 4,710 | 6,816 | 8,044 |
| ගෙවීම් .. | 87 | 90 | 109 | 115 | 124 | 3,341 | 3,852 | 5,032 | 6,293 | 7,018 |
| 2. සංචාර .. | 7 | - 2 | 6 | 40 | 43 | 258 | -87 | 278 | 2,190 | 2,468 |
| ලැබීම් .. | 55 | 48 | 59 | 94 | 114 | 2,107 | 2,072 | 2,759 | 5,143 | 6,463 |
| ගෙවීම් .. | 48 | 50 | 54 | 54 | 71 | 1,849 | 2,159 | 2,482 | 2,953 | 3,995 |
| 3. ආයෝජන ආදායම් .. | - 123 | - 122 | - 124 | - 123 | - 129 | - 4,699 | -5,266 | -5,738 | -6,685 | -7,316 |
| ලැබීම් .. | 53 | 52 | 46 | 68 | 77 | 2,055 | 2,197 | 2,106 | 3,727 | 4,364 |
| ගෙවීම් .. | 176 | 174 | 170 | 191 | 206 | 6,754 | 7,463 | 7,845 | 10,412 | 11,680 |
| 3.1 ලාභ සහ ලාභාංශ .. | - 26 | - 13 | - 13 | - 19 | - 14 | -1,025 | -581 | - 608 | -1,006 | - 783 |
| ලැබීම් .. | ... | 1 | ... | ... | 2 | 8 | 20 | 18 | 11 | 95 |
| ගෙවීම් .. | 26 | 14 | 14 | 19 | 16 | 1,033 | 601 | 626 | 1,017 | 878 |
| 3.2 පොලී .. | - 97 | - 109 | - 111 | - 104 | - 115 | -3,674 | -4,685 | -5,130 | -5,679 | -6,532 |
| ලැබීම් .. | 53 | 51 | 46 | 68 | 75 | 2,047 | 2,177 | 2,088 | 3,717 | 4,269 |
| ගෙවීම් .. | 150 | 160 | 156 | 172 | 191 | 5,721 | 6,862 | 7,219 | 9,396 | 10,802 |
| 4. රජයේ සේවා .. | 1 | 1 | 2 | - 3 | - 1 | 45 | 68 | 77 | -195 | - 34 |
| ලැබීම් .. | 16 | 17 | 17 | 11 | 16 | 609 | 735 | 785 | 586 | 932 |
| ගෙවීම් .. | 15 | 16 | 15 | 14 | 17 | 564 | 667 | 708 | 781 | 966 |
| 5. වෙනත් සේවා .. | - 7 | 4 | 2 | 5 | - 9 | - 254 | 196 | 96 | 264 | - 592 |
| ලැබීම් .. | 94 | 94 | 91 | 93 | 116 | 3,584 | 4,036 | 4,237 | 5,092 | 6,569 |
| ගෙවීම් .. | 101 | 90 | 90 | 88 | 125 | 3,828 | 3,840 | 4,141 | 4,829 | 7,161 |
| 6. මුළු සේවා .. | - 120 | - 114 | - 123 | - 72 | - 78 | -4,625 | -4,884 | -5,609 | -3,905 | -4,448 |
| ලැබීම් .. | 307 | 306 | 315 | 391 | 465 | 11,721 | 13,097 | 14,597 | 21,363 | 26,371 |
| ගෙවීම් .. | 427 | 420 | 438 | 463 | 543 | 16,346 | 17,981 | 20,207 | 25,268 | 30,819 |
| 7. පෞද්ගලික සංක්‍රාම .. | 242 | 238 | 258 | 268 | 288 | 9,226 | 10,186 | 11,840 | 14,518 | 16,334 |
| ලැබීම් .. | 270 | 266 | 279 | 296 | 320 | 10,324 | 11,386 | 12,830 | 16,054 | 18,119 |
| ගෙවීම් .. | 28 | 28 | 21 | 28 | 32 | 1,098 | 1,200 | 990 | 1,536 | 1,785 |
| 8. නිල සංක්‍රාම .. | 139 | 154 | 147 | 130 | 143 | 5,311 | 6,588 | 6,751 | 7,142 | 8,170 |
| ලැබීම් .. | 139 | 154 | 147 | 130 | 143 | 5,311 | 6,588 | 6,751 | 7,142 | 8,170 |
| ගෙවීම් .. | – | – | – | – | – | – | – | – | – | – |
| 9. මුළු සංක්‍රාම .. | 381 | 392 | 405 | 398 | 431 | 14,537 | 16,774 | 18,591 | 21,659 | 24,504 |
| ලැබීම් .. | 409 | 420 | 426 | 426 | 463 | 15,635 | 17,974 | 19,581 | 23,195 | 26,289 |
| ගෙවීම් .. | 28 | 28 | 21 | 28 | 32 | 1,098 | 1,200 | 990 | 1,536 | 1,785 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

## සංක්‍රාම ගිණුම

1990 වර්ෂය හා සසඳා බලන විට 1991 වර්ෂයේදී සංක්‍රාම ගිණුමේ දියුණුවක් දක්නට ලැබුණි. පෞද්ගලික හා නිල සංක්‍රාම යන දෙකෙහිම මුළු ශුද්ධ ලැබීම් 1990 වර්ෂයේදී විගැහි දශ ලක්ෂ 398 සිට 1991 වර්ෂයේදී විගැහි දශ ලක්ෂ 431 දක්වා වැඩි විය. ශුද්ධ පෞද්ගලික සංක්‍රාම විගැහි දශ ලක්ෂ 288 දක්වා සියයට 7 කින් වැඩි විය. පෞද්ගලික සංක්‍රාමවල ප්‍රධාන කොටසක් ලෙස සේවා නියුක්තියන්ගේ ප්‍රේෂණයන් තවදුරටත් පැවතුණි. ගල්ෆ් යුද්ධය අවසාන වීමත් සමග, 1991 වර්ෂයේ දෙවන භාගයේදී මැද පෙරදිග බලා ශ්‍රී ලාංකික ශ්‍රමිකයින් පිටත්ව යාම නිසා මෙම මූලාශ්‍රයෙන් ලැබුණු පෞද්ගලික ප්‍රේෂණයන් වැඩි විය. තවද ගල්ෆ් යුද්ධයෙන් පසුව ඇති වී ඇති අවිනිශ්චිතභාවය නිසා මැද පෙරදිග ශ්‍රමිකයින් තමුන්ගේ ඉතිරිකිරීම් මැද පෙරදිග බැංකුවල තැන්පත් නොකර ශ්‍රී ලංකාවට එවන බවක් දක්නට ලැබේ. මේ අතර, 1991 වර්ෂයේදී නිල සංක්‍රාම විගැහි දශ ලක්ෂ 143 දක්වා සියයට 10 කින් වැඩිවිය. මුළු නිල සංක්‍රාම ලැබීම් අතරෙහි අන්තර් ජාතික සංවර්ධනය සඳහා වූ එක්සත් ජනපද ඒජන්සිය විසින් ඉහත ඡේදයේ සඳහන් කරන ලද විශේෂ ගෙවීමෙහි කොටසක් පියවීම සඳහා දෙන ලද විගැහි දශ ලක්ෂ 11 (එ.ජ.ඩොලර් දශ ලක්ෂ 15)ක ප්‍රදානයක් ඇතුළත් විය.

## ජංගම ගිණුම

සේවා ගිණුමේ හා සංක්‍රාම ගිණුමේ සතුටුදායක ක්‍රියාකාරිත්වයක් පැවති නමුදු වෙළෙඳ ගිණුමේ පෙන්නුම් කළ සැලකිය යුතු පිරිහීම, ජංගම ගිණුමේ හිඟය 1990 දී විගැහි දශ ලක්ෂ 192 (රුපියල් දශ ලක්ෂ 10,390) සිට විගැහි දශ ලක්ෂ 372 (රුපියල් දශ ලක්ෂ 21,127) දක්වා පුළුල් වීමට හේතු විය. 1990 වසරේ ජංගම ගිණුමේ හිඟය පසුගිය පස් වසර තුළදී වාර්තා කරන ලද අවම හිඟය වූ අතර, 1985 න් පසු ඉහළම හිඟයක් පෙන්නුම් කරන ලද්දේ 1991 වර්ෂයේදීය. දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස ගත් විට, 1990 හා 1991 වර්ෂ දෙක තුළදී ජංගම ගිණුමේ හිඟය සියයට 3.2 සිට සියයට 5.6 දක්වා වැඩි විය. ප්‍රදානයන් ඉවත් කළ විට මෙම ප්‍රතිශතය 1990 දී සියයට 5.6 සිට 1991 දී සියයට 7.8 දක්වා ප්‍රතිශත අංක 2 කින් වැඩි විය. ජංගම ගිණුමේ හිඟයෙහි මෙම සැලකිය යුතු වැඩිවීම 1991 ගෙවුම් තුලන ක්‍රියාකාරිත්වයෙහි අයහපත් ලක්ෂණයක් විය.

## ප්‍රාග්ධන ගිණුම

ජංගම ගිණුමේ සිදුවීම්වලට වෙනස්ව ශුද්ධ මූල්‍ය නොවන ප්‍රාග්ධන ලැබීම් 1990 දී විගැහි දශ ලක්ෂ 344 සිට 1991 දී විගැහි දශ ලක්ෂ 475 දක්වා සියයට 38 ක වැඩිවීමක් පෙන්නුම් කරන ලදී. මෙම වැඩිවීමේ කැපී පෙනෙන ලක්ෂණයක් වූයේ 1990 දී විගැහි දශ ලක්ෂ 31 ක් වැනි පහත් මට්ටමක පැවතුණු සෘජු ආයෝජන විගැහි දශ ලක්ෂ 74 දක්වා ඉතා විශාල වශයෙන් වැඩි වීමයි. මෙම වැඩිවීම ම.කො.ආ.කො. යටතේ වූ ව්‍යාපාර සහ කොළඹ කොටස් වෙළෙඳපොළ තුළින් ආ විවිධ ආයෝජන යන දෙඅංශයෙහිම පිළිබිඹු විය. එය ශ්‍රී ලංකාවේ විදේශීය ආයෝජනයන් පෙළඹවීමට සපයන ලද සැලකිය යුතු දිරිගැන්වීම් ප්‍රමාණයක් සහ රජය විසින් ක්‍රියාත්මක කර ගෙන යන ව්‍යාපාරවල හිමිකාරිත්වය පවරාදීමේ වැඩ පිළිවෙළට දැක් වූ ක්ෂණික ප්‍රතිචාරයක් ලෙස පෙන්නුම් කළ හැකිය. 1990 දී මෙන්ම පෞද්ගලික ණය ප්‍රාග්ධනයෙහි ශුද්ධ ගෙවීමක් පෙන්නුම් කළේය. කෙසේ වුවත් ලැබීම් හා ගෙවීම් යන දෙඅංශයම පසුගිය වසරට වඩා වැඩිවිය. ලැබීම් ප්‍රධාන වශයෙන් ම.කො.ආ.කො. යටතේ වූ ව්‍යාපාර හා එයාර් ලංකා සමාගම විසින් ගත් ණය වූ අතර, ගෙවීම්වල එයාර් ලංකා සමාගම විසින් කරන් ලද අහස් යානා ප්‍රතිසම්පාදන වැඩ

## 1. 45 සංඛ්‍යා සටහන

### 1987 - 1991 ශ්‍රී ලංකාවේ විදේශීය වත්කම්

| කාලපරිච්ඡේදය අවසානයේ අයිතිය | විගැහි දශ ලක්ෂ (අ) | | | | | රුපියල් දශ ලක්ෂ | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1987 | 1988 | 1989 | 1990 | 1991 | 1987 | 1988 | 1989 | 1990 | 1991 |
| 1. රජය (ආ) .. | 8.6 | 13.3 | 32.3 | 19.3 | 26.7 | 373.7 | 589.8 | 1,696.1 | 1,104.5 | 1,631.6 |
| 2. රාජ්‍ය නියෝජ්‍යත්ව .. | – | – | – | – | – | 0.9 | 0.9 | 1.0 | 1.1 | 1.1 |
| 3. මහ බැංකුව .. | 202.5 | 193.0 | 191.3 | 286.3 | 475.9 | 8,839.8 | 8,575.0 | 9,962.5 | 16,399.2 | 28,956.9 |
| 4. වෙළෙඳ බැංකු .. | 212.3 | 221.8 | 223.2 | 296.4 | 306.2 | 9,264.9 | 9,859.7 | 11,729.9 | 16,966.8 | 18,633.4 |
| 5. එකතුව .. | 423.4 | 428.1 | 446.8 | 602.0 | 808.8 | 18,479.3 | 19,025.4 | 23,389.5 | 34,471.6 | 49,233.0 |
| 6. දළ විදේශීය සම්පත් මගින් කළ හැකි ආනයන-මාස ගණන .. | | | | | | | | | | |
| 6.1 වෙළෙඳ භාණ්ඩ .. | 3.2 | 3.1 | 3.1 | 3.7 | 4.4 | | | | | |
| 6.2 භාණ්ඩ හා සේවා .. | 2.5 | 2.5 | 2.5 | 3.0 | 3.5 | | | | | |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.


(අ) ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමග එකගවන ලද නියෝජන අනුපාතිකයට අනුව පරිවර්තනය කරන ලද මහ බැංකුවේ ජාත්‍යන්තර සංචිතයේ සමහර ශීර්ෂයන් හැර ඉතිරිය පහත සදහන් කාලපරිච්ඡේද අවසානයේ වූ විනිමය අනුපාතිකයන්ට අනුව පරිවර්තනය කර ඇත.

| වර්ෂය | 1987 | 1988 | 1989 | 1990 | 1991 |
|---|---|---|---|---|---|
| විගැහි 1 කට රුපියල් | 43.64 | 44.45 | 52.57 | 57.25 | 60.85 |

(ආ) භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් නමින් ඇති ගිණුමේ හර ශේෂයන් ඇතුළත් කිරීම සඳහා 1985 සිට සංඛ්‍යා සංශෝධනය කර ඇත.

# විදේශ වත්කම්

ත්‍රෛමාසිකව




ශ්‍රී ලංකා මහ බැංකුව.

පිළිවෙළ යටතේ කෙරුණු ප්‍රගති ගෙවීම් ඇතුළත් විය.1990 සිට 1991 අතර පෞද්ගලික කෙටිකාලීන ණය ශුද්ධ උපයෝගීකරණය විගැහි දශ ලක්ෂ 48 සිට විගැහි දශ ලක්ෂ 34 දක්වා අඩු විය. මෙහිදී, ලැබීම්වල වැඩි වීමක් පැවති අතර, ශුද්ධ ලැබීම්වල සමස්ත අඩුවීමට හේතු වූයේ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් කරන ලද විශාල ආපසු ගෙවීමය.

රජයට ලැබුණු මූල්‍ය නොවන ශුද්ධ ප්‍රාග්ධන ලැබීම් 1990 දී විගැහි දශ ලක්ෂ 298 සිට 1991 දී විගැහි දශ ලක්ෂ 390 දක්වා වැඩි විය. වසර දෙක තුළදී ණය ආපසු ගෙවීම් සමාන තත්ත්වයක පැවතුණු අතර දිගුකාලීන ප්‍රාග්ධන ලැබීම් 1991 දී විගැහි දශ ලක්ෂ 461 දක්වා සියයට 18 කින් වැඩි විය. මෙයින් වැඩි කොටසක් සහනදායී පහසුකම් ණය ලෙස ජපානය (විගැහි දශ ලක්ෂ 154) ජාත්‍යන්තර සංවර්ධන සංගමය (විගැහි දශ ලක්ෂ 138) සහ ආසියානු සංවර්ධන බැංකුව (විගැහි දශ ලක්ෂ 105) මගින් ලැබුණු අතර, එයිනුත් වැඩි කොටසක් ආර්ථිකයේ ප්‍රතිව්‍යුහාත්මක කටයුතු සඳහා ගෙවුම් තුලන ආධාර වශයෙන් ලැබුණි. ඊට අමතරව එ.ජ.ඩොලර් දශ ලක්ෂ 50 ක විශේෂ ගෙවීම්වල කොටසක් පියවීම සඳහා රජය විසින් එ.ජ. රජයේ, ඇප සහිත විගැහි දශ ලක්ෂ 23 (එ.ජ.ඩොලර් දශ ලක්ෂ 30)ක කෙටි කාලීන තාවකාලික ණයක්ද ලබා ගෙන ඇත.

## විදේශීය වත්කම්

පසුගිය වර්ෂය අවසානයේදී පැවති විගැහි දශ ලක්ෂ 602 ක් වූ ශ්‍රී ලංකාවේ දළ විදේශීය වත්කම්, 1991 වර්ෂය අවසානයේදී විගැහි දශ ලක්ෂ 809 දක්වා සියයට 34 ක වැඩිවීමක් වාර්තා කෙරිණි. මෙම වැඩිවීම 1990 වර්ෂය අවසානයේදී විගැහි දශ ලක්ෂ 286 සිට 1991 වර්ෂය අවසාන වන විට විගැහි දශ ලක්ෂ 476 දක්වා වැඩි වූ ශ්‍රී ලංකා මහ බැංකුවේ විදේශීය වත්කම්වලින් සම්පූර්ණයෙන්ම වාගේ පෙන්නුම් කෙරිණි. රජයේ වත්කම් ද විගැහි දශ ලක්ෂ 27 දක්වා විගැහි දශ ලක්ෂ 7 කින් වැඩි වූ අතර, මේ නිසා 1990 වර්ෂය අවසානයේදී දශ ලක්ෂ 306 ක්ව පැවති ශ්‍රී ලංකා මහ බැංකුවේ හා රජයේ විදේශීය වත්කම් වලින් සමන් විත දළ නිල සංචිත 1991 වර්ෂය අවසානයේදී විගැහි දශ ලක්ෂ 503 දක්වා වැඩි විය. මේ අතර, වාණිජ බැංකු සතු විදේශීය වත්කම් 1990 වර්ෂය අවසානයේදී විගැහි දශ ලක්ෂ 296 සිට 1991 වර්ෂය අවසානයේදී විගැහි දශ ලක්ෂ 306 දක්වා විගැහි දශ ලක්ෂ 10 ක වැඩිවීමක් පෙන්නුම් කෙරිණි. 1991 වර්ෂය අවසානයේදී පැවති දළ විදේශීය වත්කම් ප්‍රමාණය 1992 අපේක්ෂිත ආනයනයන්ගෙන් මාස 4.2 ක ප්‍රමාණය මූල්‍යනය කිරීමට ප්‍රමාණවත් විය.


## විනිමය අනුපාතික සංචලනයන්

ඇ.එ.ජ. ඩොලරය හැරුණු විට, අනිකුත් සියළුම ප්‍රධාන මුදල් වර්ගවලට ප්‍රතිමුඛව 1991 දී ශ්‍රී ලංකා රුපියල උච්චාවචනය විය. මැදිහත් මුදල් වර්ගය වූ එ.ජ.ඩොලරයට ප්‍රතිමුඛව ශ්‍රී ලංකා රුපියල වසර මුළුල්ලේම පිරිහීමක් පෙන් වූ අතර 1990 වර්ෂය අවසානයේ සිට 1991 වර්ෂය අවසානය දක්වා සියයට 5.5 ක පිරිහීමක් පෙන්නුම් කළේය. මේ අතර, එක්සත් රාජධානි පවුම්, ඩොයිෂ් මාර්ක්, ජපන් යෙන් හා ප්‍රංශ ප්‍රැන්ක් වලට ප්‍රතිමුඛව වූ සංචලනයන් 1991 පෙබරවාරි මාසය දක්වා පිරිහීමක් පෙන්නුම් කළ අතර, ගල්ෆ් යුද්ධය අවසාන වීමෙන් පසු එ.ජ.ඩොලරය හා එක්ව ජූලි මාසය දක්වා අගය වැඩි වූ අතර වර්ෂය අවසාන කාලයේදී නැවතත් පිරිහිණි. මෙම සංචලනයන්ගේ සමස්ත ප්‍රතිඵලය වූයේ, 1990 වර්ෂය අවසානයේ සිට 1991 වර්ෂය අවසානය දක්වා ශ්‍රී ලංකා රුපියල, ජපන් යෙන්වලට ප්‍රතිමුඛව සියයට 13.2 කින්ද, ඩොයිෂ් මාර්ක්වලට ප්‍රතිමුඛව සියයට 6.7 කින්ද, ප්‍රංශ ප්‍රැන්ක්වලට ප්‍රතිමුඛව සියයට 5.9 කින් හා එක්සත් රාජධානියෙහි

## සඵල විනිමය අනුපාතික *

ත්‍රෛමාසික සාමාන්‍ය

1985 = 100




* Decline indicates depreciation.

ශ්‍රී ලංකා මහ බැංකුව.

## 1. 46 සංඛ්‍යා සටහන

## 1987 - 1991 විනිමය අනුපාතික වෙනස් වීම

| මුදල් වර්ගය | වර්ෂය අගදී පැවති අනුපාතික (ඒකකයකට රුපියල්) | | | | | පෙර වර්ෂයට වඩා ප්‍රතිශතය වෙනස්වීම් (අ) | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1987 | 1988 | 1989 | 1990 | 1991 | 1987 | 1988 | 1989 | 1990 | 1991 |
| ඩොයිෂ් මාර්ක් .. | 19.2826 | 18.4794 | 23.7002 | 26.1554 | 28.0178 | - 23.91 | 4.35 | - 22.03 | - 9.39 | - 6.65 |
| ප්‍රංශ ප්‍රැන්ක් .. | 5.6936 | 5.4121 | 6.9354 | 7.7125 | 8.1924 | - 22.13 | 5.20 | - 21.96 | - 10.08 | - 5.86 |
| ඉන්දියානු රුපියල් .. | 2.4043 | 2.1848 | 2.3603 | 2.2332 | 1.6352 | - 9.97 | 10.05 | - 7.44 | 5.69 | 36.57 |
| ජපන් යෙන් .. | 0.2491 | 0.2631 | 0.2816 | 0.2943 | 0.3390 | - 27.98 | - 5.32 | - 6.58 | - 4.29 | -13.19 |
| ස්ටර්ලින් පවුම් .. | 57.1721 | 59.0786 | 65.0400 | 75.5908 | 79.5820 | - 26.89 | - 3.23 | - 9.17 | - 13.96 | - 5.02 |
| ඇ.එ.ජ. ඩොලර් .. | 30.7625 | 33.0325 | 40.0000 | 40.2400 | 42.5800 | - 7.29 | - 6.87 | - 17.42 | - 0.60 | - 5.50 |
| විශේෂ ගැනුම් හිමිකම් .. | 43.2684 | 44.2820 | 52.9300 | 57.2479 | 60.8464 | - 19.57 | - 2.29 | - 16.34 | - 7.54 | - 5.91 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

(අ) වෙනස්වීම් ගණන් බලා ඇත්තේ ශ්‍රී ලංකා රුපියලට අදාළ විදේශීය ව්‍යවහාර මුදල් වටිනාකම පදනම් කරගෙනය.
සටහන : සෘණ සලකුණින් ශ්‍රී ලංකා රුපියලෙහි අගය අඩුවීම පෙන්නුම් කරයි.

පවුමට ප්‍රතිමුඛව සියයට 5.0 කින්ද පිරිහීමයි. ඒ අනුව විගැහි වලට ප්‍රතිමුඛව ශ්‍රී ලංකා රුපියල 1990 හා 1991 අවසානය අතර සියයට 5.9 කින් පිරිහිණි. මේ අතර 1991 දී ඉන්දියානු රුපියලේ අගය අව ප්‍රමාණය කිරීමේ හේතුවෙන්, මෙම කාලය තුළදී ශ්‍රී ලංකා රුපියල ඉන්දියානු මුදලට ප්‍රතිමුඛව සියයට 36.6 ක අගය වැඩි වීමක් පෙන්නුම් කළේය.

මෙම විනිමය අනුපාතික සංචලනයන්ගේ ඒකාබද්ධ ප්‍රතිඵල පෙන්නුම් කරමින්, ප්‍රධාන වෙළෙඳ හවුල්කරුවන් සමග වූ නාමික විනිමය අනුපාතික වෙළෙඳ බර තැබීම මත පිළියෙළ වූ ශ්‍රී ලංකාවේ නාමික සඵල විනිමය අනුපාතිකය, ඒකක පදනම අනුව බලන විට 1991දී සියයට 0.01 ක පිරිහීමක් පෙන්විය. එහෙත් ශ්‍රී ලංකාව හා එහි ප්‍රධාන වෙළෙඳ හවුල්කරුවන් අතර, උද්ධමන වෙනස්කම් සඳහා ගලපා ගත් පසු ලැබෙන මූර්ත සඵල විනිමය අනුපාතිකය, ඒකක පදනම අනුව බලන විට, සියයට 4.4 කින් ඉහළ යාමක් පෙන්විය. 1991 වසරේ මූර්ත සඵල විනිමය අනුපාතිකයේ වාර්ෂික සාමාන්‍යය සියයට 1.1 කින් අඩු වූ අතර, නාමික සඵල විනිමය අනුපාතිකයේ වාර්ෂික සාමාන්‍යය සියයට 5.3 කින් වැඩි විය.

## විදේශීය ණය

වර්ෂය තුළදී විගැහි දශ ලක්ෂ 476 ක වැඩිවීමක් පෙන්නුම් කරමින් ශ්‍රී ලංකාවේ මුළු නොපියවා ඉතිරිව ඇති විදේශීය ණය 1991 වර්ෂය අවසාන වන විට විගැහි දශ ලක්ෂ 4,598 ක් යැයි ගණන් බලා ඇත. මෙම වැඩිවීමේ විශාල කොටසක් විගැහි දශ ලක්ෂ 3,190 සිට විගැහි දශ ලක්ෂ 3,601 දක්වා වැඩි වූ රජයේ දිගු හා මැදි කාලීන ණය වැඩිවීම තුළින් පෙන්නුම් කෙරිණි. ප්‍රධාන වශයෙන් ජපානය, ජාත්‍යන්තර සංවර්ධනය සංගමය සහ ආසියානු සංවර්ධන බැංකුවෙන් ගත් දිගුකාලීන සහනදායී ණය වලින් මෙම වැඩිවීම සමන්විත වූ අතර අතිකුත් බහුපාර්ශ්වික හා ද්විපාර්ශ්වික විදේශීය ණයවල එතරම් වෙනසක් පෙන්නුම් නොකෙරුණි. මේ අතර ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (ජා.මූ.අ.) වැඩි කළ ව්‍යුහාත්මක ගැලපුම් පහසුකම් යටතේ ප්‍රථම අදියර වශයෙන් විගැහි දශ ලක්ෂ 56 ක් නිකුත් කළ නමුදු, ජා.මූ.අ. ණය ආපසු ගෙවීම් වැඩිවීම නිසා ජා.මූ.අ.ට නොපියවා ඉතිරිව ඇති ණය 1990 වර්ෂය අවසානය හා සසඳා බලන විට විගැහි දශ ලක්ෂ 288 සිට විගැහි දශ ලක්ෂ 280 දක්වා අඩු විය. විශේෂ ගෙවීම් සඳහා කෙටිකාලීන ණයක් වශයෙන් රජය විසින් ලබා ගත් විගැහි දශ ලක්ෂ 21 ක ප්‍රමාණයක් රජයේ නොපියවා ඉතිරිව ඇති කෙටිකාලීන ණය වශයෙන් සඳහන් විය. මේ අතර නොපියවා ඉතිරිව ඇති අතිකුත් කෙටිකාලීන ණය, 1990 වර්ෂය අවසානයේදී විගැහි දශ ලක්ෂ 294 සිට 1991 අවසානයේදී විගැහි දශ ලක්ෂ 328 දක්වා වැඩි විය. මෙය ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ විගැහි දශ ලක්ෂ 30 ක් වූ ශුද්ධ ආපසු ගෙවීම්, මහ කොළඹ ආර්ථික කොමිසම යටතේ පැවැත්වෙන ව්‍යාපාරවල ආනයන ණය වැඩිවීම සහ 1991 අගෝස්තු මාසයෙන් පසු අපනයනකරුවන්ට වි.ව්‍යා.බැ.මූ, ඒකක මගින් ණය දීමේ පහසුකම් ව්‍යාප්ත කිරීම නිසා වි.ව්‍යා.බැ.මූ. ඒකක මගින් ගත් කෙටි කාලීන ණය වැඩිවීමෙහි ඒකාබද්ධ ප්‍රතිඵලයක් විය.

## ණය සේවා ගෙවීම්

දිගු හා මැදි කාලීන ණය ආපසු ගෙවීම් හා සියළුම ණය මත පොළී ගෙවීම් ඇතුළත් ණය සේවා ගෙවීම් 1990 සිට 1991 දක්වා විගැහි දශ ලක්ෂ 329 සිට විගැහි දශ ලක්ෂ 354 දක්වා විගැහි දශ ලක්ෂ 25 කින් වැඩිවිය. මෙම වැඩිවීම ණය ආපසු ගෙවීම් පොළී ගෙවීම් යන දෙඅංශයෙන්ම සමන්විත විය. ණය ආපසු ගෙවීමවලට මුළු මනින්ම වාගේ හේතු වූයේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ණය ආපසු ගෙවීමය. රජයේ ණය ආපසු ගෙවීම් 1991 වර්ෂයේදී ද, පසුගිය වර්ෂයේ

## 1987 - 1991 නොපියවා ඉතිරිව ඇති විදේශීය ණය

| වර්ගය | විගැහි දශ ලක්ෂ | | | | | රුපියල් දශ ලක්ෂ | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1987 | 1988 | 1989 | 1990 (අ) | 1991 (අ) | 1987 | 1988 | 1989 | 1990 (අ) | 1991 (අ) |
| 1. මැදි හා දිගු කාලීන ණය .. | 3,228 | 3,531 | 3,642 | 3,828 | 4,249 | 138,740 | 155,353 | 190,802 | 217,151 | 255,939 |
| 1.1 රජයේ ණය (අ) .. | 2,615 | 2,848 | 2,976 | 3,190 | 3,601 | 113,134 | 126,230 | 157,520 | 182,606 | 219,098 |
| 1.2 රජයේ ඇපය සහිත රාජ්‍ය සංස්ථා ණය | 224 | 182 | 154 | 136 | 132 | 9,703 | 8,137 | 8,136 | 7,781 | 8,034 |
| 1.3 රජයේ ඇපය සහිත පෞද්ගලික අංශයේ ණය .. | 96 | 112 | 108 | 108 | 120 | 4,139 | 4,359 | 6,035 | 6,185 | 7,319 |
| 1.4 රජයේ ඇපය රහිත රාජ්‍ය සංස්ථා ණය | 8 | 7 | 6 | 5 | 3 | 329 | 284 | 341 | 290 | 197 |
| 1.5 රජයේ ඇපය රහිත පෞද්ගලික අංශයේ ණය .. | 120 | 128 | 123 | 101 | 113 | 5,209 | 5,482 | 6,516 | 5,802 | 6,854 |
| 1.6 ජාත්‍යන්තර මූල්‍ය අරමුදලින් කළ ගැණුම් | 165 | 254 | 275 | 288 | 280 | 6,226 | 10,861 | 12,255 | 14,488 | 14,437 |
| 2. කෙටි කාලීන ණය .. | 203 | 179 | 297 | 294 | 349 | 8,348 | 7,252 | 13,210 | 16,820 | 20,130 |
| 2.1 රජය .. | - | - | - | - | 21 | - | - | - | - | 1,275 |
| 2.2 මහ බැංකුවේ ණය ගැනීම් .. | 41 | 5 | 50 | - | - | 1,801 | 231 | 2,632 | - | - |
| 2.3 අනෙකුත් (ඇ) (අ) .. | 162 | 174 | 246 | 294 | 328 | 6,547 | 7,021 | 10,578 | 16,820 | 18,855 |
| 3. මුළු ණය (1+2) .. | 3,431 | 3,710 | 3,939 | 4,122 | 4,598 | 147,088 | 162,605 | 204,012 | 233,971 | 276,069 |
| විශේෂිත අයිතිමයන් | | | | | | | | | | |
| මැදි හා දිගුකාලීන ණය | | | | | | | | | | |
| 1. යෝජනා ක්‍රම ණය .. | 1,697 | 1,907 | 2,050 | 2,179 | 2,380 | 73,428 | 84,427 | 108,521 | 124,775 | 144,810 |
| 2. යෝජනා ක්‍රම නොවන ණය .. | 918 | 942 | 926 | 1,010 | 1,228 | 39,706 | 41,703 | 48,998 | 57,832 | 74,703 |
| 3. සැපයුම් කරුවන්ගේ ණය .. | 30 | 25 | 20 | 33 | 37 | 1,311 | 1,109 | 1,046 | 1,892 | 2,253 |
| 4. ජා. මූ. අ. භාරකාරත්ව අරමුදලේ ණය | 34 | 18 | 9 | 6 | 5 | 1,475 | 813 | 479 | 325 | 322 |
| 5. ජා. මූ. අ. අනෙකුත් ණය .. | 165 | 254 | 275 | 288 | 280 | 6,226 | 10,861 | 12,255 | 14,488 | 14,437 |
| 6. අනෙකුත් (ඈ) .. | 384 | 386 | 362 | 312 | 319 | 16,594 | 16,440 | 19,502 | 17,840 | 19,414 |

මූලයන් : ශ්‍රී ලංකා මහ බැංකුව,
විදේශ සම්පත් දෙපාර්තමේන්තුව

(අ) සංශෝධිත.
(ආ) තාවකාලික.
(ඇ) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ප්‍රතිග්‍රහණ ණය, වෙළෙඳ ණය සහ විදේශීය ව්‍යවහාර මුදල් බැංකු ඒකකයන්ගෙන් ලබාගත් කෙටිකාලීන ණයඇතුළත්ව.
(ඈ) රාජ්‍ය සංස්ථා හා පෞද්ගලික අංශය මගින් ගත් ණය ඇතුළුව දිගු කාලීන ණය.

## 1. 48 සංඛ්‍යා සටහන

## 1987 - 1991 ණය සේවා ගෙවීම්

| ශීර්ෂය | විගැහි දශ ලක්ෂ | | | | | රුපියල් දශ ලක්ෂ | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1987 | 1988 | 1989 | 1990 (අ) | 1991 (ආ) | 1987 | 1988 | 1989 | 1990 (අ) | 1991 (ආ) |
| 1 ණය සේවා ගෙවීම් .. | 383.2 | 402.8 | 374.7 | 328.5 | 353.5 | 14,539 | 17,207 | 17,138 | 17,971 | 20,010 |
| 1.1 ණය ආපසු ගෙවීම් .. | 253.5 | 258.8 | 217.3 | 182.0 | 197.7 | 9,623 | 11,033 | 9,920 | 9,975 | 11,190 |
| (i) ජා. මූ. අරමුදලට .. | 69.3 | 64.1 | 46.0 | 31.8 | 63.6 | 2,566 | 2,682 | 2,018 | 1,731 | 3,600 |
| (ii) අනෙකුත් .. | 184.2 | 194.7 | 171.3 | 150.2 | 134.1 | 7,057 | 8,351 | 7,902 | 8,244 | 7,590 |
| 1.2 පොළී ගෙවීම් .. | 129.8 | 144.5 | 157.4 | 146.6 | 155.8 | 4,916 | 6,174 | 7,218 | 7,997 | 8,820 |
| (i) ජා. මූ. අරමුදලට .. | 18.3 | 18.5 | 22.7 | 20.6 | 14.7 | 663 | 772 | 997 | 1,121 | 830 |
| (ii) අනෙකුත් .. | 111.5 | 125.5 | 134.7 | 126.0 | 141.1 | 4,253 | 5,402 | 6,221 | 6,876 | 7,990 |
| 2. වෙළෙඳ භාණ්ඩ අපනයන හා සේවාවන්ගෙන් ඉපැයීම් .. | 1,384.4 | 1,404.0 | 1,522.4 | 1,847.3 | 1,955.7 | 52,819 | 60,082 | 70,772 | 100,844 | 110,750 |
| 3. වෙළෙඳ භාණ්ඩ අපනයන, සේවා හා පෞද්ගලික සංක්‍රාම ලැබීම් .. | 1,654.7 | 1,670.6 | 1,801.6 | 2,143.7 | 2,275.5 | 63,143 | 71,468 | 83,602 | 116,898 | 128,868 |
| 4. ණය සේවා අනුපාතික (ඇ) | | | | | | | | | | |
| 4.1 2 හි ප්‍රතිශතයක් වශයෙන් .. | | | | | | | | | | |
| (i) සමස්ත අනුපාතිකය .. | 27.7 | 28.7 | 24.6 | 17.8 | 18.1 | 27.5 | 28.6 | 24.2 | 17.8 | 18.1 |
| (ii) ජා. මූ. අරමුදලේ ගනුදෙනු හැර .. | 21.4 | 22.8 | 20.1 | 14.9 | 14.1 | 21.4 | 22.9 | 20.0 | 15.0 | 14.1 |
| 4.2 3 හි ප්‍රතිශතයක් වශයෙන් | | | | | | | | | | |
| (i) සමස්ත අනුපාතිකය .. | 23.2 | 24.1 | 20.8 | 15.3 | 15.5 | 23.0 | 24.1 | 20.5 | 15.4 | 15.5 |
| (ii) ජා. මූ. අරමුදලේ ගනුදෙනු හැර .. | 17.9 | 19.2 | 17.0 | 12.9 | 12.1 | 17.9 | 19.2 | 16.9 | 12.9 | 12.1 |
| 5. 1 හි ඇතුළත් රජයේ ණය සේවා ගෙවීම් කොටස (ඇ) .. | 179.0 | 191.4 | 196.3 | 168.0 | 172.9 | 6,816 | 8,214 | 9,066 | 9,141 | 9,786 |
| 5.1 එය 1 හි ප්‍රතිශතයක් වශයෙන් .. | 46.7 | 47.5 | 52.4 | 51.1 | 48.9 | 46.9 | 47.7 | 52.9 | 50.9 | 48.9 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

(අ) සංශෝධිත

(ආ) තාවකාලික

(ඇ) වර්ෂය තුළ විනිමය අනුපාතිකයන්හි සිදු වූ වෙනස් වීම් හේතුවෙන්, රුපියල් වටිනාකම හා විගැහි වටිනාකම අනුව වෙන් වෙන් වශයෙන් ගණනය කරන ලද ණයසේවා අනුපාතිකයන් වෙනස් වේ.

පැවති මට්ටමට සමාන ප්‍රමාණයකින් පැවති අතර, පෞද්ගලික අංශයේ ණය ආපසු ගෙවීම් අඩු විය. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි පොළී ගෙවීම් විගැහි දශ ලක්ෂ 21 සිට විගැහි දශ ලක්ෂ 15 දක්වා වර්ෂ දෙක තුළදී අඩු වූ අතර, අතිකුත් ණය සඳහා පොළී ගෙවීම් විගැහි දශ ලක්ෂ 126 සිට 141 දක්වා වැඩිවිය. එබැවින් ණය සේවා ගෙවීම්, භාණ්ඩ සහ සේවා අපනයනයන්ගේ ඉපැයීම්වල ප්‍රතිශතයක් වශයෙන් ගත් කල 1991 දී සියයට 18.1 ක් වූ අතර, මෙය 1990 පැවති තත්ත්වයට ආසන්න විය. ණය සේවා ගෙවීම්, භාණ්ඩ හා සේවා අපනයනයන්ගේ සහ පෞද්ගලික සංක්‍රාමයන්ගේ ලැබීම්වල අනුපාතයක් ලෙස ගත් කල, 1991 සියයට 15.5 වූ අතර මෙය 1990 පැවති අනුපාතය හා සම මට්ටමක විය.